මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර-තාක්ෂණික සේවා ගණය (MN-03-2006A)සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය.

## 01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව: මිනින්දෝරු දෙපාර්තමේන්තුව
යොමු අංකය :සීපී/බ.ගැ.ප./පොදු — දිනය : 2012-07-02

1.2 අමාත්‍යාංශය : ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
යොමු අංකය : 2-1/2/1/මි.දෙ/10(2) — දිනය : 2012-07-06

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම. — යොමු අංකය : DMS/G 1/40/03 — දිනය : 2011-07-08, 2012-09-18

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය — යොමු අංකය:EST-2/RECRU/02/0261 දිනය : 2012-09-21
EST-2/RECRU/02/0216

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය :NSCC/5/39/3/SR-1 Vol:IV දිනය : 2012-08-17
NSCC/5/39/3/SR-1

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය — යොමු අංකය : PSC/EST/7/1/39/5/201 දිනය :2014-04-24

## 02. පත්කිරීමේ බලධරයා පිළිබඳ විස්තර

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සර්වේයර් ජනරාල්

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර-තාක්ෂණික

3.2. ශ්‍රේණි ක්‍රමය :පුහුණු, III, II, I

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකාරීත්වය හා මුදල් පරිහරණය අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුළත් බහුකාර්ය (Multi Functional) ස්වරූපයේ කාර්යයන් ඉටු කරන සේවා ගණයකි.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

## 04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : MN 3-2006-A

5.2. වැටුප් පරිමාණය : රු:15005-4x180-6x240-11x320-20x360-27885

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු: 15005/- |
| II | පියවර 12 | රු: 17485/- |
| I | පියවර 23 | රු: 21045/- |

රා.ප.ච. 06/2006 ඇමුණුම 111 අනුව
පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව :- 1 වසර - රු. 12.920.00
2 වසර - රු. 13.040.00

සටහන :

පුහුණුව සාර්ථකව නිම කල පසු මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වනු ලබන තාක්ෂණික ශිල්පි ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වූවන් III වන ශ්‍රේණියට පත්කරනු ලබන අතර නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

## 06.සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | ප්‍රධාන කාර්යයන් |
|---|---|---|---|
| 01.සිතියම් තාක්ෂණ නිලධාරී | 111/11/1 | 574 | තේමා සිතියම්,භූලක්ෂණාත්මක සිතියම්, සහ අනෙකුත් සිතියම් වල දත්ත සැකසුම, දත්ත පද්ධතිවලට දත්ත ඇතුලත් කිරීම, දත්ත පද්ධති ඇසුරෙන් සිතියම් නිෂ්පාදනය, පුණරීක්ෂණය, තත්ව පාලනය,අලෙවිය ඇතුලු සිතියම් නිෂ්පාදනයට අදාල අනෙකුත් තාක්ෂණ කටයුතු.මැනුම් පිළිබඳ කාර්යාලීය මූලික හා අවසන් කටයුතු, මහජනයාට පිඹුරු පිටපත් නිකුත් කිරීම, ඒට අදාල ලේඛණ පවත්වාගෙන යාම, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ මැනුම් දත්ත පද්ධති වල කටයුතු. |
| 02. ජායාරේඛණමිතික ශිල්පි | 111/11/1 | 26 | ගුවන් ජායාරූප ආධාරයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිතියම් සැකසීමට අදාල දත්ත රැස්කිරීම. |
| 03. දුරස්ථ ග්‍රහණ කාර්මික ශිල්පි | 111/11/1 | 09 | ගුවන් ජායාරූප හා චන්ද්‍රිකා දත්තයන්ගේ අර්ථ නිරූපනය හා විශ්ලේෂණය හා එමගින් සිතියම් සැකසීමට අදාල දත්ත රැස්කිරීම, ඒවා පරිගණකගත කිරීම, අවශ්‍ය දත්ත ලබාදීම. |

| | | | |
|---|---|---|---|
| 01 ගුවන් ජායාරූප ශිල්පි හා රසායනාගාර කාර්මික ශිල්පි | 111/11/1 | 06 | ගුවන්ගතවී ත්‍රිමාණික ජායාරූප ගැනීම සහ එම ජායා ඵලකයන්ගේ විකාශනික කටයුතු සිදුකිරීමත් එම ජායා පටය ආධාරයෙන් ජායාරේඛණ සඳහා අවශ්‍ය වන ඵලකයන් සැකසීම විශාලිත ජායාකරන මුද්‍රණ පිටපත් ඍජුකරණ ජායාපිටපත් සහ ස්පර්ශිත මුද්‍රණ පිටපත් සකස් කිරීම. |
| 05. ලිතෝ මුද්‍රණ ශිල්පි | 111/11/1 | 15 | සිතියම් හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් මුද්‍රණ කටයුතු කිරීම |
| 06. පිඹුරුවර්ණ මුද්‍රණ ශිල්පි | 111/11/1 | 07 | පරිගණකය භාවිතයෙන් සිතියම් හා පිඹුරු සැකසීමට අවශ්‍ය අක්ෂර හා ඒ ආශ්‍රිත නිර්මාණ සැකසීම හා මුද්‍රණය (සිතියම්කරණය සඳහා Type Setting). පිඹුරු හස්ත මුද්‍රණය(Hand Stamping) සාමාන්‍ය මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් විවිධ මුද්‍රණ කටයුතු සිදුකිරීම. කාර්යාලීය සාමාන්‍ය ලිපි ලේඛන පරිගණක මුද්‍රණ කටයුතු හා සාමාන්‍ය යන්ත්‍ර භාවිතයෙන් මුද්‍රණ කටයුතු කිරීම. |
| 07. ප්‍රවාහන නිලධාරි | 111/11/1 | 01 | දෙපාර්තමේන්තුව සතු වාහන ධාවනයට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික තොරතුරු සපයා දීම. අලුත්වැඩියාවන්ට අවශ්‍ය නිර්දේශ හා කාර්මික වාර්තා ලබා දීම. අලුත්වැඩියාවලින් පසු වාහනවල ධාවන තත්වය පරික්ෂා කිරීම. වාහන නඩත්තුව පිළිබඳ පරික්ෂා කිරීම. රියදුරන්ට උපදෙස් දීම. රිය අනතුරුවලදී එහා පරික්ෂා කරබලා වාර්තා ලබාදීම සහ අබලන් වාහන ගර්හිත කිරීම ආදි කටයුතු. පරිසර හිතකාමී සහතික ලබා ගැනීම සඳහා වාහන සැකසීම. |
| 08. ගොඩනැගිලි පරිපාලක | 111/11/1 | 01 | වාර්ෂික ගොඩනැගිලි නඩත්තු සැලැස්ම සකස් කිරීම ගොඩනැගිලි නඩත්තු ක්‍රියාවලිය කළමනාකරණයට යෝජනා කිරීම. සේවක කණ්ඩායම් සුපරික්ෂාව නඩත්තුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය. උපකරණ ගබඩා කිරීම හා කළමනාකරණය ගෙවීම් කටයුතු සඳහා මිනුම් ගැනීම සහ නිර්දේශ ලබා ගැනීම. |

6.2.

| | | |
|---|---|---|
| ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව | - | 639 |
| සිතියම් තාක්ෂණ නිලධාරි | - | 574 |
| ජායාරේඛණමිතික ශිල්පි | - | 26 |
| දුරස්ථ ග්‍රහණ කාර්මිකශිල්පි | - | 09 |
| ගුවන් ජායාරූප ශිල්පි හා රසායනාගාර කාර්මික ශිල්පි | - | 06 |
| ලිතෝ මුද්‍රණ ශිල්පි | - | 15 |
| පිඹුරුවර්ණ මුද්‍රණ ශිල්පි | - | 07 |
| ප්‍රවාහන නිලධාරි | - | 01 |
| ගොඩනැගිලි පරිපාලක | - | 01 |

සටහන :

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III,II,I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ. |

සටහන:

| | |
|---|---|
| සටහන :- | I. III, II, I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.<br>II. සීමිත තරඟ විභාගයෙන් බඳවාගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.<br>III. පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි. |

7.2. විවෘත බඳවාගැනීම

7.2.1. බඳවාගන්නා ශ්‍රේණිය - (1) පුහුණු කිරීමේ ශ්‍රේණිය - දෙවසරක පුහුණුව සඳහා
(11) III ශ්‍රේණිය ( ප්‍රවාහන නිලධාරි හා ගොඩනැගිලි පරිපාලක තනතුරු සඳහා පමණක් අදාළ වේ.)

7.2.2. සුදුසුකම්

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් –

(අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව. ගණිතය. විද්‍යාව සහ තවත් එක් විෂයකටසම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් හයකින් (06) අධ්‍යන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

(අ) සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයන් දෙක (02) සහිතව විද්‍යා විෂයන් තුන (03) කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම් –111 ශ්‍රේණිය ප්‍රවාහන නිලධාරී හා ගොඩනැගිලි පරිපාලක තනතුරු සඳහා පමණක් අදාල වේ.

ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා යාන්ත්‍රික ක්ෂේත්‍රයෙන්ද. ගොඩනැගිලි පරිපාලක තනතුර සඳහා සිවිල් ක්ෂේත්‍රයෙන්ද පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

(අ). මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(ඇ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(ඉ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

(ඊ) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

(උ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3. පළපුරුද්ද - අදාල නොවේ.

7.2.2.4. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. සේවයට බඳවාගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාල සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.2.3. වයස

7.2.3.1. අවම සීමාව අවුරුදු 18
7.2.3.2. උපරිම සීමාව අවුරුදු 30

7.2.4. බඳවාගැනීමේ ක්‍රමය

7.2.4.1. ලිඛිත විභාගය -(01 පරිශිෂ්ඨය)

ලිඛිත විභාගයේ කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ. තනතුරු කිහිපයකට එකවර අයදුම්පත් කැඳවන අවස්ථාවකදී අයදුම්කරුවන්ගේ මනාපය අනුව කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

7.2.4.1.1 පවත්වන බලධාරියා - සර්වේයර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය -අදාල නොවේ.

7.2.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාල නොවේ.

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - අධ්‍යාපන සුදුසුකම්වලට අදාල සහතික පරීක්ෂා කිරීම. (ලකුණු ලබාදෙනු නොලැබේ.)

7.2.4.4.1සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා - සර්වේයර් ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය -

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම්පල කිරීම මගින් හෝ ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීම සහ වෙබ් අඩවියේ පල කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවාගැනීම (ප්‍රවාහන නිලධාරි හා ගොඩනැගිලි පරිපාලක තනතුරු සඳහා අදාළ නොවේ.)

7.3.1. බඳවාගන්නා ශ්‍රේණිය -පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)

7.3.2. සුදුසුකම්

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් –

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකද විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් – අදාල නොවේ

7.3.2.3. පළපුරුද්ද -

1. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තනතුරක් දැරීම හා එම තනතුරෙහි ස්ථිර කර තිබීම.
2. ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.2.4. කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2. වෙනත්

පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

නියමිත දිනට පූර්වාසන්න රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් සහතික කර තිබීම.

සේවයට බඳවාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.3. බඳවාගැනීමේ ක්‍රමය

7.3.3.1. ලිඛිත විභාගය -(02 පරිශිෂ්ඨය)

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

- ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.
- තනතුරු කිහිපයකට එකවර අයදුම්පත් කැඳවන අවස්ථාවකදී අයදුම්කරුවන්ගේ මනාපය අනුව කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

7.3.3.1.1 පවත්වන බලධාරියා
සර්වේයර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.3.3.2. වෘත්තීය පරීක්ෂණය -අදාළ නොවේ.

7.3.3.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාල නොවේ.

7.3.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්දට අදාළ සහතික පරීක්ෂා කිරීම
( ලකුණු ලබාදෙනු නොලැබේ)

7.3.4.4.1සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා -
සර්වේයර් ජනරාල්

7.3.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - අභ්‍යන්තර දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීම පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සටහන - (ප්‍රවාහන නිලධාරී හා ගොඩනැගිලි පරිපාලක තනතුරු සඳහා අදාළ නොවේ.)
ඉහත 7.2 හා 7.3 යටතේ බඳවාගන්නා අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් අදාල තනතුර සඳහා පවත් වනු ලබන දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් සහිත තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලබන අතර සීමිත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයින් ඔවුන්ගේ පූර්ව තනතුරු වලට මුදාහැරේ.

සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයින් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වන විභාගය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීම් ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාලසීමාව සතුටුදායක ලෙස ගත කරන නිලධාරියකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහල වැටුප් පියවරේ පිහිටවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත්වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

7.4. කුසලතා මත බඳවාගැනීම - අදාල නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

## 09. භාෂා ප්‍රවීණතාවය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

## 10. ශ්‍රේණි උසස් කිරීම

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

11. තනතුරුවලට පත් කිරීම - අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිරවන්නාවූ කොන්දේසි: ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධි විධාන හා කොන්දේසි අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිරවන්නාවූ අර්ථ නිරූපන

13.1 සක්‍රීය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලයන් සඳහා ගණනය කරනු නොලබන්නේය

14. සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම -
ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

15. සැම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිසන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ : අත්සන ........................ 2015.05.13

02/05/2015

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

ඩී. ... එම්. එස්. එන්. චාන්දනී
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් කාර්යාලය
තැ. පෙ. 506, කිරුළ පාර,
කොළඹ 05

පරීක්ෂා කලේ: අත්සන: ........................ 15/5/19

2015.05.20.

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

පී. ඩබ්ලිව්. රාජපක්ෂ
...සර්වේයර් ජනරාල්
(මානව සම්පත)
සර්වේයර් ජන...
තැ.පෙ. 506, කිර... කොළඹ 05.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර : පී. එම්. පී. උදයකාන්ත
සර්වේයර් ජනරාල්

දිනය : 2015.05.20

නිලමුද්‍රාව

යොමු අංකය : 2/3/03/62

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර- තාක්ෂණික සේවා ශ්‍රේණිය (MN-3-2006A) සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................

නම :

ලේකම් ආචාර්ය අයි. එච්. කේ. මහානාම
ලේකම්
ඉඩම් අමාත්‍යාංශය ඉඩම් අමාත්‍යාංශය
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

දිනය : 2015.06.08

නිලමුද්‍රාව

යොමු අංකය : PSC/EST/9/1/29/5/2012

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර- තාක්ෂණික සේවා ශ්‍රේණිය (MN-3-2006A)සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය 2014.04.24 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ........................

නම :

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2015.08.05

නිලමුද්‍රාව ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

## 01 වන පරිශිෂ්ටය

01. විභාගයේ නම - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල පුහුණු කිරීමේ ශ්‍රේණියට හා 111 ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු [illegible] | [illegible] |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | [illegible] |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා - සර්වේයර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාග පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග - පුරප්පාඩු ඇතිවූ විට

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල පුහුණු කිරීමේ ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ තරඟ විභාගයේ විෂය නිර්දේශය</u>

1. බුද්ධි පරීක්ෂණය
   - අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තියන්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය
   - ගණිතය
     - වීජ ගණිතය (අසමානතා,විචල්‍ය,ශ්‍රේණි,ලඝුගණක)
     - ත්‍රිකෝණමිතිය ( සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
     - සංඛ්‍යානය (මධ්‍යයන, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)
   - භෞතික විද්‍යාව
     - ආලෝකය සහ ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය, දර්පන, වක්‍ර පෘෂ්ඨය,ප්‍රිස්ම, කාච, ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය) නිව්ටන් යාන්ත්‍ර විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)
   - විවිධ මාතෘකා
     - භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ, ආදිය)
     - ඝන වස්තුවල කෝණික දෘෂ්ඨිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර : පී. එම්. පී. උදයකාන්ත
සර්වේයර් ජනරාල්

දිනය : 2015.05.20

නිලමුද්‍රාව

(02 වන පරිශිෂ්ඨය )

01. විභාගයේ නම - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලපුහුණු කිරීමේශ්‍රේණියට අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවාගැනීමේ තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය. | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා - සර්වේයර් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග - පුරප්පාඩු ඇතිවූ විට

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

I. බුද්ධි පරීක්ෂණය

- අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ හැකියාවත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

II. විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

- ගණිතය
  ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
  සංඛ්‍යානය (මධ්‍යයන, මාතය, සම්මත අපගමනය)
  සම්භාව්‍යතාවය

- භෞතික විද්‍යාව
  ආලෝකය සහ ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය, දර්පන, වක්‍ර පෘෂ්ඨය, ප්‍රිස්ම, කාච, ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර.
- විවිධ මාතෘකා
  භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ, ආදිය)
  ඝන වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම
  මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලබන සිතියම් වර්ග

අත්සන .........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර : පී. එම්. පී. උදයකාන්ත
සර්වේයර් ජනරාල්

දිනය : 2015.05.20

තිලමුද්‍රාව